# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

## පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## අධ්‍යක්ෂක තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂක තනතුර සඳහා යෝග්‍ය පරිදි සුදුසුකම් ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යවස්ථාවට අනුකූලව අධ්‍යක්ෂකවරයා පූර්ණකාලීන නිලධාරියෙක්, ප්‍රධාන විධායක නිලධාරියෙක්, ප්‍රධාන අධ්‍යයන නිලධාරියෙක් සහ ආයතනයේ ගණන්දීමේ නිලධාරියා ද වේ. අධ්‍යක්ෂවරයා ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා මෙන්ම ආයතනයේ එක් එක් අධ්‍යයන මණ්ඩලයේ ද සාමාජිකයෙකි. නිල කාලය වසර තුනක් වන අතර, අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු අතර, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 63 ට වඩා අඩු විය යුතුය.

අපේක්ෂිත අයදුම්කරු සතුව අධ්‍යක්ෂ මණ්ඩල සහතිකකරණය හෝ වෛද්‍ය විද්‍යාව පිළිබඳ විශේෂ ආචාර්ය උපාධි (PhD හෝ සමාන) සුදුසුකම් තිබිය යුතුය. අධ්‍යයන ආයතන පරිපාලන පළපුරුද්ද අමතර සුදුසුකමකි. සාර්ථක අයදුම්කරු සතුව බහු විනය අධ්‍යයන පසුබිමක රාජකාරී කිරීමට අවශ්‍ය විශිෂ්ට අන්තර් පුද්ගල කුසලතා සහ ආයතනය පිළිබඳ කැපවීමක් හා අවබෝධයක් තිබිය යුතුය. ඔහු/ ඇය අධ්‍යයන නායකත්වය ලබා දීම සඳහා වගකිව යුතුය.

තනතුරට අදාළ වැටුපක් සහ වෙනත් දීමනා ලැබීමට අධ්‍යක්ෂවරයා සුදුසුකම් ලබයි.

අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලිපිලේඛන ඉදිරිපත් කළ යුතුයි.

i. අයදුම්කරුගේ උපන් දිනය ඇතුළුව සම්පූර්ණ ජීව දත්ත තොරතුරු පත්‍රිකාවක්.

ii. ආයතනයේ සංවර්ධනය පිළිබඳ දැක්ම සම්බන්ධ ප්‍රකාශයක් සහ තනතුරට පත්කළහොත් මුදුන්පමුණුවා ගැනීමට අයදුම්කරු විසින් කරනු ලබන තත්වයන් පිළිබඳ කෙටි විස්තරයක්.

iii. රාජ්‍ය සේවයේ, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා උසස් අධ්‍යාපන ආයතනවල සේවය කරන අයදුම්කරුවකු නම් ඔහු /ඇය එම තනතුරට පත් කළහොත් සේවයෙන් නිදහස් කළ හැකිද යන්න සඳහන් සේවා යෝජකයාගේ ලිපියක් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

**අයදුම්පත් 2024 මාර්තු 04 වන දින ප.ව. 3.30 ට හෝ ඊට පෙර** සහකාර ලේඛකාධිකාරී වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ වැඩකරන දිනයක පැමිණ භාරදීම සිදුකළ යුතුය. අයදුම්පත්‍ර බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "**අධ්‍යක්ෂක තනතුර**" ලෙස සඳහන් කළ යුතු වේ.

මෙයට අමතරව, ඉහත ලිපිලේඛනවල මෘදු පිටපතක් ඇමුණුම් සමග PDF ආකාරයෙන් ar@pgims.pdn.ac.lk විද්‍යුත් ලිපිනයට ඉහත සඳහන් දිනට පෙර යොමුකළ යුතුය.

අධ්‍යක්ෂක තනතුරට පත්කිරීමේ ක්‍රියාපටිපාටිය පිළිබඳ වැඩි විස්තර සඳහා 2024 ජනවාරි 01 දිනැති 01/2024 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය වෙත යොමු වන්න.

වැඩිදුර තොරතුරු විමසීම් සඳහා සහකාර ලේඛකාධිකාරී වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (දුරකථන අංක 081-2389757) කාර්යාල වේලාවන් තුළ දී අමතන්න.

**සහකාර ලේඛකාධිකාරී,**
**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය.**

**2024 පෙබරවාරි 04.**